මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන විධාන 2018 අංක 03 2018 ජූනි 06

## ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 12 වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත පහත දැක්වෙන පරිදි අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයන් නියම කරනු ලැබේ.

1. අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා

1.1 2018 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක්ම සෑම විටකම පහත දැක්වෙන 1 සහ 2 වගු ප්‍රකාරව අවදානම අනුව බර තබන ලද මුළු වත්කම් මත අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත පවත්වා ගත යුතුය.

වගුව 1: රුපියල් බිලියන 100 ට අඩු වත්කම් සහිත බලපත්‍රලාභී මුදල් සමාගම්

| ප්‍රාග්ධන සංරචක | 2018.07.01 | 2019.07.01 | 2020.07.01 | 2021.07.01 |
|---|---|---|---|---|
| පළමු පෙළ ප්‍රාග්ධනය | 6.00 | 6.50 | 7.00 | 8.50 |
| මුළු ප්‍රාග්ධනය | 10.00 | 10.50 | 11.00 | 12.50 |

වගුව 2: රුපියල් බිලියන 100 සහ ඊට වැඩි වත්කම් සහිත බලපත්‍රලාභී මුදල් සමාගම්

| ප්‍රාග්ධන සංරචක | 2018.07.01 | 2019.07.01 | 2020.07.01 | 2021.07.01 |
|---|---|---|---|---|
| පළමු පෙළ ප්‍රාග්ධනය | 6.00 | 7.00 | 8.00 | 10.00 |
| මුළු ප්‍රාග්ධනය | 10.00 | 11.00 | 12.00 | 14.00 |

1.2 ඉහත දැක්වෙන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත මෙහි I වන උප ලේඛනයෙහි ඇතුළත් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා වන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා රාමුවෙහි සඳහන් ක්‍රමවේදයන්ට සහ අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි ගණනය කළ යුතුය.

2. නියාමන වාර්තා කිරීම

2.1 සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක්ම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවන් ගණනය කිරීමේ තොරතුරු II වන උපලේඛනයේ සඳහන් වන ආකෘතීන්ට අනුව ජාලගත පද්ධතිය හරහා පහත දැක්වෙන ආකාරයට ඉදිරිපත් කළ යුතුය.

(i) මාසිකව: සෑම මසකම අවසාන කැලැන්ඩර දිනට තත්ත්වය දින 15 ක් ඇතුළත වාර්තා කළ යුතුය.

(ii) වාර්ෂිකව (විගණනය කළ): සෑම මූල්‍ය වර්ෂයකම අවසාන කැලැන්ඩර දිනට තත්ත්වය මූල්‍ය වර්ෂය අවසාන වී මාස 3 ක් ඇතුළත වාර්තා කළ යුතුය.

3. අනුකූල නොවන අවස්ථාවක දී ගනු ලබන නියාමන ක්‍රියාමාර්ග

3.1 බලපත්‍රලාභී මුදල් සමාගමක් ඉහත සඳහන් විධානයන්ට අනුකූල නොවන අවස්ථාවක දී අධ්‍යක්ෂ විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග අතරින් එකක් හෝ කිහිපයක් ගනු ලැබේ.

(i) ලාභාංශ ගෙවීම හෝ ලාභ බෙදා හැරීම සීමා කිරීම

(ii) නියාමන ප්‍රාග්ධන තත්ත්වය තවදුරටත් දුර්වල කෙරෙන ඕනෑම ව්‍යාපාර කටයුත්තක් අත්හිටුවීම

3.2 අනුකූල නොවන අවස්ථාවන් නිවැරදි කිරීමක දී, අධ්‍යක්ෂ විසින් ඉහත දැක්වෙන නියාමන ක්‍රියාමාර්ග ඉවත් කරනු ලැබේ.

4. අර්ථ නිරූපණයන්

4.1 මෙම විධානයන් හි,

(i) ඉහත 1.1 කොටසෙහි 1 සහ 2 වගුවල දැක්වෙන බලපත්‍රලාභී මුදල් සමාගමක වත්කම් වල වටිනාකම නිර්ණය කිරීමේ දී විගණනය කරන ලද ආසන්නතම මූල්‍ය වාර්තාව පදනම් කර ගත යුතුය.

(ii) "අධ්‍යක්ෂ" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ අදහස් වේ.

| | | | |
|---|---|---|---|
| 5. | පෙර විධානය අහෝසි කිරීම | 5.1 | 2006 අංක 02 දරන මුදල් සමාගම් (අවදානම අනුව බර තබන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය) විධානය සහ 2017.03.15 දිනැති චක්‍රලේඛය මෙමගින් අහෝසි කෙරේ. |

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

පාද සටහන: මෙම විධානයේ I සහ II යන උපලේඛනයන් සඳහා පහත දැක්වෙන අන්තර්ජාල සබැඳිය වෙත යොමු වන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb.documents/laws/cdg/Finance_Business_Act_Directions_No_3_of_2018_e.pdf